
# ගොවියා මුල්කර ගතයුතු

## ජලපාලනය



වාරිමාර්ග පද්ධතියක් ඉදි කිරිමේදී එයින් වාසි ලබන පිරිස ගොවී ජනතාවයි.

පොදු අරමුණු ඉටුකර ගැනීමෙ ක්‍රියා මාර්ගයක දී එම ක්‍රියා මාර්ගයෙන් වාසි ලබන පිරිස, ඒ සඳහා සහභාගිකර ගැනීම්, සහභාගිත්වය ලෙස සලකමු. වාරිමාර්ග පද්ධතියක් ඉදි කිරිමේදී හෝ පුනරුත්ථාපනයේදී එයින් මුලින්ම වාසි ලබන පිරිස වාරී ක්‍රමයෙන් ජලය ලබා ගොවිතැන් කටයුතු කරන ගොවි ජනතාවය.

සහභාගිත්වය සම්පූර්ණවීමට නම් තීරණ ගැනීමේදී හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේදී යන අවධින් දෙකේදීම සහභාගිවිය යුතුය. සහභාගිවීම හුදෙක් අදහස් විමසීමකින් සම්පූර්ණ නොවේ. සහභාගිවූ පිරිස ක්‍රියා මාර්ගයේ කොටස්කරුවන් විය යුතුය.

වාරිමාර්ග ප්ද්ධතියක් ඉදි කිරිමක දී හෝ පුනරුත්ථාපනයකදී ගොවි ජනතාව සහභාගිවිය යුතු ප්‍රධාන අවස්ථා කීපයක් ඇත.

1. වාරි පද්ධතිය සැලසුම් කිරීමේදී
2. ඉදි කිරීමේ කටයුතු වලදී
3. වාරි පද්ධතිය ක්‍රියා
4. නඩත්තුවේදී සහ ආරක්‍ෂා කිරීමේදී.

මෙම අවස්ථාවල දී ගොවී සහභාගිත්වය ලබා ගැනිම තුලින් අ෴ප්ක්‍ෂා කළ හැකි කරුණු කීපයකි,

1. ගොවිතැන් කටයුතුවල නියැලෙන ගොවී ළහතුන්ගේ අත්දැකීම් පදනම් වූ දැනුම ලබා ගැනීම.
2. ඔවුන් තුළ වාරි පද්ධතින් ඉදි කරනවිට එහි කොටස් කරුවන්ය යන හැඟීම ඇති කිරීම,
3. වාරි පද්ධතිය පරිහරණයේ දී සහ ජල පරිහරණයේ දී ඇතිවන අකාර්යක්‍ෂමතා මග හැර ගැනීම.

සඳහා ඒ, ගොවීන්ට වග කීම පැවැරීම.

අපගේ පුරාණ වාරි කර්මාන්ත වලදී මෙම සහභාගිත්වය එතරම් ගැටළුමය බව ඉතිහාසයෙන් පෙනේ. එයට හේතුව වූයේ වාරි මාර්ග ඉදිකරණ එය ක්‍රියා කරවන මෙන්ම එයින් ප්‍රයෝජන ලබන පිණිස එකම පිරිසක් වීමය. එනම් පුරාණ ලාංකික ගොවි ජනතාවයි. අප ඉතිහාසයේ සිදුවූ නොයෙකුත් විපර්යාසවලට පසු අද, වැව හද ජලය බෙදන්නෝ සහ එයින් ප්‍රයෝජන ලබන්නෝ දෙපිරිසකි. වාරි පද්ධතිය ක්‍රියා කරවන පිරිස විද්‍යා දැණුම ලැබූ ඉංජිනේරුවරු සහ කාර්මික නිල ධාරීන් වන අතර එය පරිහරණය කරන අනෙක් පිරිස ගොවි ජනතාවයි.

විද්‍යාත්මක ඉංජිනේරු ශිල්ප යට අනුකූලව වාරි කර්මාන්තය ආරම්භවූ පසු කාලයක් තිස්සේ මේ දෙපිරිස අතර දුරස්ථ සම්බන්ධ තාවයක් හටගෙන ඇත. යම් යම් අවස්ථාවල අදහස් විමසීමක් සිදු වුවක්, ගොවි ජනතාවට වාරි පද්ධතිය තමන්ගේය යන හැඟීම ඇතිවන අයුරින් සහභාගිත්වයක් ලබා ගෙන නැත. එම නිසා ගොවි ජනතාව තුලින් තමන් එහි කොටස්කරුවන් යන හැඟීම බොහෝ දුරට ඉවත් වී තිබේ. මේ හේතු නිසා වාරි මාර්ග පද්ධති තුළ නොයෙකුත් අර්බුද ඇති වී ඇත.

1. වාරිමාර්ග පද්ධතිය ඉදි කිරීමේදී එහි තත්ත්වය හා ගුණය පිළිබඳව එය පරිහරණය කරන ගොවි ජනතාවට බලපෑම් කළ නොහැකිවීම. එම නිසා විවේචන සහ චෝදනා එල්ල කිරීම.
2. වාරි මාර්ග පද්ධතිය පරිහරණයේදී අකාර්යක්ෂම ලෙස සහ අපරීක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම.
3. අකාර්යක්ෂම ජල පරිහරණය අසාධාරණ පරිහරණ තත්ත්වය සහ ජලය අපතේ යැවීම.
4. ගොවි අතර සහ නිලධාරීන් හා ගොවීයන් අතර නිතර ගැටුම් ඇතිවීම.

ගල්ඔය ජල පාලන පුනරුත්ථාපන ව්‍යාපෘතිය තුලින් වාරි මාර්ග පද්ධතිය තුල වී වගාව සඳහා ජලය සැපයෙන වම් ඉවුර ප්‍රදේශයේ අක්කර 15,000 ක ප්‍රමාණයක, ගොවි සංවිධාන ව්‍යාපාරයක් දියත් කර ඇත. 1981 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වී ඇති මෙය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ඒකාබද්ධ වැඩ සටහනකි. මේ තුලින් වාරි මාර්ග පද්ධතිය ඉදි කිරීමේදී හා ක්‍රියා කරවීමේ දී ගොවි සහභාගිත්වය ලබා දීමට යම්තාක් දුරට සමත් වී ඇත. ගල්ඔය ජලපාලන ව්‍යාපෘතිය යටතේ සිදු වන්නේ වාරි මාර්ග කටයුතු අනමෙහෙයවන ආකාරය පුනරුත්ථාපනය කිරීමකි.

ගොවි සංවිධාන ව්‍යාප්තියේ
පුහුණු කිරීමේ ගොවි සංවිධායක
**රත්නසිරි ඒකනායක**
විසිනි.

මෙම පුනරුත්ථාපන ව්‍යාපාරයේදී ගොවි සහභාගිත්වය ලබා ගත් ආකාරය දැන් සලකා බලමු.

## සැලසුම් කරණයේදී

ගොවීන්ගේ කුඹුරු වලට ජලය ලැබෙන කෙත් ඇලවල් සැලසුම් කිරීමේදී ඒ ඒ කෙත් ඇලවලට ගොවි සහභාගිත්වය ලබා ගනියි. ආරම්භයේ දී සිට අද දක්වා මෙම සහභාගිත්වය ලබා ගැනීම ක්‍රම දෙකකට සිදුකර ඇත.

1. කෙත් ඇලට අදල සැලසුම් ඉංජිනේරු මහතුන් සහ එම් කෙත් ඇල වලින් ජලය ලබා ගන්නා සියළුම ගොවීන් රැස්වීම් ශාලාවක දී හමුවී සාකච්ඡා කර තීරණයන්ට එළඹීම.
2. ඉංජිනේරු මහතා ගොවීන් සමග කෙත් ඇල දිගේ ගමන් කරමින් අදහස් ලබා ගැනීම.

මුල් කාලයේ දී අනුගමනය කරන ලද්දේ මුල් ක්‍රමය පමණකි. එහිදී කෙත් ඇලේ සිටින සියළුම ගොවි මහතුන් ගොවි සංවිධායක වරයා ගේ සම්බන්ධතාවයකින් යුතුව කෙත් ඇලේ නිර්මිත ඉදිකළ යුතු ස්ථාන සහ ඇල සකස් විය යුතු ආකාරය පිළිබඳ පොදු නිගමනයකට පැමිනේ. ඉන් පසුව අදල ඉංජිනේරුවරු සමග රැස්වීමේදි සාකච්ඡා කරයි. ඉංජිනේරුවරු සිතියම් වලින් එම ස්ථාන ලකුණු කරගැනීම කෙරේ. ඉංජිනේරු තාක්ෂණය සහ ඒ ඒ කෙත් ඇලවලට වියදම් කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය සලකා බලා ඒවායින් ඇත්ත වශයෙන්ම ඉටුකළ හැකි දේ පිළිබඳ දැනුම්දීම සිදු වන්නේ ඉන් පසුවයි.

මෙහිදී තමන් ඉදිරිපත් කරන අදහස් සියල්ලම ඉටුවේ යැයි විශ්වාසත් ඔවුන් තුල නොමැති බැව් ගොවිහු දක්වූහ. ඒ නිසා එයින් පසුව දැන් දෙවැනි ක්‍රමය අනුගමනය කරනු ලැබේ. එහිදී

වර්තමානයේ ඉංජිනේරු වරු ගොවින් සමග කෙත් ඇලේ ඉදි කිරීම් කටයුතු පිළිබඳව ඔවුන් දක්වන කරුණු පැහැදිලිව දැනගත හැකි වනවා මෙන්ම එම අවස්ථා වේදීම යම් පැහැදිලි අදහසක් දිය හැකිවේ. එසේම ඒ ඒ කරුණු පිළිබඳව ගොවීන් සමග අදහස් හුවමාරු කරගත හැක. මේ ආකාරයෙන් ගල්ඔය වම් ඉවුරේ උහන ප්‍රදේශයේ සියළුම කෙත් ඇලවල සැලසුම් නිම කර ඉදි කිරීම් කටයුතු සිදු වෙමින් පවතී. අනෙක් ප්‍රදේශවල සැලසුම් රැස්වීම් පැවැත් වේ. ඉදිකිරීම් නිම කළ ප්‍රදේශයේ ගොවි මහතුන්ගේ ඉල්ලීම් 75%කට වඩා ඒ අයුරින්ම ඉටුවූ බව ඔවුහු පවසති.

## ඉදිකිරීමේදී

ඉදිකිරීම කටයුතු වලදී ගල්ඔය ජල පාලන ව්‍යාපෘතියෙහි ගොවි සහභාගිත්වය ලබා ගැනීම අංශ කීපයකින් සිදුවී ඇත.

(1) කෙත් ඇලවල පස් වැඩ ගොවි මහතුන් විසින් ශ්‍රම දානයෙන් නිම කිරීම.

(2) කෙත් ඇලවල කොන්ක්‍රීට ඉදිකිරීම් වැඩ කෙත් ඇල ගොවි සංවිධානයට කොන්ත්‍රාත් ගතහැකිවීම.

(3) වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිසංස්කරණය කරණු ලබන කෙත් ඇල නිර්මිත ඉදි කිරීම සඳහා ශ්‍රමිකයන් ඒ ඒ කෙත් ඇල සංවිධාන වලින් ගැනීම.

(4) බෙදුම් ඇලවල, ශාඛා ඇල වල, මහ ඇලවල ඉදි කිරීම සිදුවන ආකාරයෙන් මතුවන ගැටළු සාකච්ඡා කිරීම සඳහා මාසිකව වාරි මාර්ග නිලධාරි කෙත් ඇල සංවිධානවල ගොවි නියෝජිත සාකච්ඡා පැවැත්වේ.

(5) ඉදිකිරීම් කටයුතු භාරව කටයුතු කරන කාර්මික සහකාරවරු ඉදිකිරීම් කටයුතුවලදී, කෙත් ඇල සංවිධානවල ගොවි නියෝජිත සහාය ලබා ගනියි.

ගොවින් විසින් තම තමන්ගේ කෙත් ඇලවල පස් වැඩ කිරීම, දැනට පුනරුත්ථාපන කටයුතු විශාල ප්‍රමාණයකින් කෙටි කර උහන ප්‍රදේශයේ 75% කට වඩා නිම කර ඇත. ඇතැම් අවස්ථා වලදී ගොවීන් විසින් දින 5-10 ක් පමණ එක් කෙත් ඇලක පස්වැඩ නිම කිරීම සඳහා ගත කරයි. වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාරවරු විසින් ඇල කැපියයුතු සහ පිරවිය යුතු ප්‍රමාණ සලකුණු කිරීමෙන් පසුව ගොවීන් විසින් ශ්‍රමදානයෙන් කරනු ලබන පස් ගෙන ඒමට අසීරු ස්ථාන වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුව පස් ප්‍රවාහනය සඳහා සපයයි.

කෙත් ඇල සංවිධාන මගින් ඉදිකිරීමට නිර්මිත කොන්ත්‍රාත් ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව අවස්ථාව සපයා ඇත. දැනට ආරම්භයක් ලෙසින් උහන ප්‍රදේශය කෙත් ඇල සංවිධාන කිහිපයක් මගින් කොන්ත්‍රාත්තුවක් ගෙන නිම කර ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම ඉදිකිරීම් ඔවුන් කරන ලද ඉදි කිරීම් ගැන සතුටට පත්වී ඇත. වැඩ කොට සෙහි සාපේක්ෂව ගුණාත්මක බව පිළිබඳව වාරිමාර්ග නිලධාරීන් ප්‍රකාශ කර ඇත.

වාරි මාර්ග දෙපාර්තමේන්තුව ඇතැම් කෙත් ඇල වල අබලන් වූ නිර්මිත ප්‍රතිසංස්කරණය කරමින් එහිදී වැටුප් ශ්‍රමිකයන් සැපයීමට බොහෝ ස්ථානවල කෙත් ඇල සංවිධානවලට භාර දී ඇත. තමන්ගේ කෙත් ඇලෙහි ඉදි කිරීම් කටයුතු වලට සම්බන්ධවන ගොවීහු වැටුපක්ද ලබා ගනිති. එහිදී කාර්යක්ෂම ශ්‍රමයත් සමග තත්ත්වයෙන් උසස් වැඩ කොටසක් නිමකිරීමට හැකි වී ඇත.

කෙත් ඇලවල් ඉදිකිරීමට සහභාගි වන මෙම අවස්ථා හැරුනු කොට බෙදුම් ඇලවල සහ ශාඛා ඇලවල ඉදිකිරීම් කෙරිගෙන යන ආකාරය සහ එයින් පැන නගින ගැටලු නිරාකරණය සඳහා ගොවි සංවිධාන නියෝජිත වාරිමාර්ග නිලධාරි රැස්වීම මාසිකව පැවැත්වේ. එහිදී ඒ ඒ ප්‍රදේශවල ඉදිකිරීම්වල තත්ත්වය හා ගුණාත්වය පිළිබඳවද ඉදි කෙරෙන ආකාරය නිසා පැන නගින අතුරු ගැටලු පිළිබඳවද සාකච්ඡාවට භාජනය වේ. ඒ අනුව අවධාරණය කළ යුතු තැන් නැවත සකස් කිරීමක් වාරි මාර්ග නිලධාරින් විසින් කරනු ලැබේ. ගොවියාගේ සාධාරණ ඉල්ලීම පරිදි බොහෝ ඇත.

## වාරිපද්ධතිය ක්‍රියා කරවීමේදී

ජලය බෙද හැරීමේදී ගොවි සම්බන්ධතාවය මෙහි දී විමසා බලමු. ජල හිඟ යල් කන්නවලදී විශේෂයෙන් කැපී පෙනුණු පදිරි ගොවීන්ටත් ජල මුර ක්‍රම ක්‍රියාත්මක කර ඇත. කෙත් ඇල තුල ජල මුරකැම මගින් කෙත් ඇලේ අභාවයටත් ඇල මුල කුඹුරු කට්ටිවලටත් සමබර වතුර ප්‍රමාණයක් ලැබෙන අයුරින් ක්‍රියා කර ඇත. එසේම දිය බෙදුම් ඇලවල කෙත් ඇලවල ගොවි නියෝජිතයන් රැස්වී කෙත් ඇලවල් අතර ජල මුර ක්‍රම ක්‍රියාත්මක කර ඇත. මේ හැර දැනට කන්නයේ ජලය නිකුත් කිරීම තීරණය කිරීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ගොස් සංවිධාන නියෝජිතයින් යොදු ගොවි අදහස් ඉදිරිපත් කර ඇත.